**එන්එස්බී ෆන්ඩ් මැනේජ්මන්ට් කොම්පැනි ලිමිටඩ් - 2017**

**------------------------------------------------------------------------**

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරිමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ එන්එස්බී ෆන්ඩ් මැනේජ්මන්ට් කොම්පැනි ලිමිටඩ් හි ("සමාගම") මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

**------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ( "අධ්‍යක්ෂ මණ්ඩලය") වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**--------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට අයත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටී සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

-------------------

### 2.1 මතය

----------

සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් පිලිබඳ වාර්තාව

---------------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තියේ අවශ්‍යතාවයන්ට අනුව, පහත දෑ සම්බන්ධයෙන් කරුණු ගෙනහැර දක්වමි.

අ) විගණන මතය සඳහා පදනම හා විෂය පථය සහ විගණන සීමාකිරීම් ඉහත සඳහන් පරිදි වේ.

ආ) මා දරන්නා වූ මතය වන්නේ,

- මා විසින් විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් ලබාගන්නා ලද බව සහ මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සමාගම විසින් නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව.

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ අවශ්‍යතාවයන්ට අනුකූල බවය.

### 2.3 ලැබිය යුතු ගිණුම්

---------------------

#### 2.3.1 ලැබිය යුතු දෑ

-----------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවලින් නිරූපනය වන රු.246,939,587 ක ශේෂය මහා භාණ්ඩාගරය විසින් 2017 දෙසැම්බර් 31 දිනට සනාථ කර නොතිබුණි. තවද, මෙම ශේෂය විගණිත දිනය වන විටත් අයකරගෙන නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

-------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් කටයුතුවලින් රු.538,843,262 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් ද ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ ලාභය රු.109,141,803 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලවල රු.429,701,459 ක වර්ධනයක් දැක්වුණි.

මූල්‍ය මෙවලම්වල මුහුණත අගයෙහි ශුද්ධ ලාභය(Net gain) ලාභාලාභ ගිණුමේ රු.411,958,928 කින් හෙවත් සියයට 422 කින් ඉහළ යාම මූල්‍ය ප්‍රතිඵලයේ මෙම වර්ධනය කෙරෙහි බලපෑ ප්‍රධාන සාධකය වී තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

**3.2.1 වැදගත් ගිණුම්කරණ අනුපාත**

ඉදිරිපත් වූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ හා පසුගිය වර්ෂයේ සමාගමේ වැදගත් අනුපාතයන් ක්ෂේත්‍රයේ අනුපාතයන් සමඟ සන්සන්දනය කර පහත දැක්වේ.

| අනුපාත වර්ගය | **ක්ෂේත්‍රය | සමාගම | |
|---|---|---|---|
| | **2017** | **2017** | **2016** |
| **ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය** | | | |
| අවදානම් හරිත ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව (Risk weighted capital adequacy) (ප්‍රතිශතය) (අවමය 10%) | 56 | 22 | 25 |
| **ලාභදායීත්ව අනුපාත** | | | |
| සාමාන්‍යය වත්කම් මත ප්‍රතිලාභ (සියයට) | 5 | 5 | 1 |
| සාමාන්‍යය ස්කන්ධය මත ප්‍රතිලාභ (සියයට) | 13 | 20 | 5 |
| බදු පෙර ලාභය (රු.මිලියන) | 15,100 | 539 | 109 |
| බදු පසු ලාභය (රු.මිලියන) | 13,400 | 363 | 79 |
| මූලික ප්‍රාග්ධනය (අවම මූලික ප්‍රාග්ධනය රු.මිලියන 1,000) | | 1,945 | 1,691 |

** ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්ෂේත්‍ර අනුපාත ප්‍රකාශයට පත් කර තිබුණි.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාගමේ අවදානම් හරිත ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය ක්ෂේත්‍රයේ අනුපාතයට වඩා අඩු වී තිබුණි. එය 2016 වර්ෂයට වඩා සියයට 12 ක අඩු වීමකි.

(ආ) සමාගමේ වත්කම්වල සාමාන්‍යය මත ප්‍රතිලාභ අනුපාතය සහ සාමාන්‍ය ස්කන්ධය මත ප්‍රතිලාභ අනුපාතය 2017 වර්ෂයේදී පිළිවෙලින් සියයට 5 ක් සහ සියයට 20 ක් දක්වා 2016 වර්ෂයේදී පැවති සියයට 1 ක් සහ සියයට 5 ක සිට ඉහළ ගොස් තිබුණි. තවද, වත්කම් මත ප්‍රතිලාභ (ROA) කර්මාන්තයේ අනුපාතයට සමානව පැවැති නමුත් ස්කන්ධය මත ප්‍රතිලාභ (ROE) සමාලෝචිත වර්ෂයේ කර්මාන්තයේ අනුපාතයට වඩා ඉහළ අනුපාතයක් ගෙන තිබුණි.

(ඇ) 2016 වර්ෂයේ රු.මිලියන 1,691 ක්ව පැවැති සමාගමේ මූලික ප්‍රාග්ධනය 2017 වර්ෂයේදී රු.මිලියන 1,945 කින් හෙවත් සියයට 15 කින් ඉහළ ගොස් තිබුණි. එය අවම මූලික ප්‍රාග්ධන අවශ්‍යතාවය වන රු.මිලියන 1,000 ට වඩා ඉහළ අගයකි. සමාගම විසින් ප්‍රසාද කොටස් ප්‍රකාශයට පත්කිරීම නිසා සමාගමේ මූලික ප්‍රාග්ධනය එලෙස ඉහළ ගොස් තිබූ බව සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී විසින් මාහට දන්වන ලදී.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------------

### 4.1 සැලසුම් කිරීම

----------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 පරිච්ඡේදය ප්‍රකාරව සංයුක්ත සැලැස්මක් හෝ 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සමාගම විසින් පිළියෙල කර නොතිබුණි.

### 4.2 වෙළඳපොල කොටස

-----------------------------

ඉදිරිපත් වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂයේ සමාගම් මුළු වත්කම් රු.මිලියන 9,159 ක් හා කර්මාන්තයේ මුළු වත්කම් රු.මිලියන 337,200 ක් වූ අතර ඉකුත් වර්ෂය සමඟ සන්සන්දනය කිරීමේදී එය රු.මිලියන 10,862 ක් සහ රු.මිලියන 264,500 ක් විය. 2016 වර්ෂය සමඟ සැසඳීමේදී සමාගමේ වත්කම් පදනම් කරගත් වෙළඳපොල කොටස සියයට 3 සිට සියයට 4 දක්වා අඩු වී තිබුණි. 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේදී රජයේ සුරැකුම්පත්වල ආයෝජනය සියයට 20 කින් අඩුවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

------------------------------------------

### 5.1 අභ්‍යන්තර විගණනය

------------------------------

සමාගම විසින් වෙනමම අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබූ අතර ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අභ්‍යන්තර විගණන ඒකකය එන්එස්බී ෆන්ඩ් මැනේජ්මන්ට් කොම්පැනි හි අභ්‍යන්තර විගණක වශයෙන් කටයුතු කිරීම පිරිවැය ඵලදායි විගණන කටයුත්තක් වී තිබුණි.

## 6. පද්ධති හා පාලන

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳ වරින් වර සමාගමේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| සැලසුම් කිරීම | සමාගමේ ප්‍රධාන අරමුණු ඉලක්කගත කාලසීමාව තුළ සාක්ෂාත් කරගැනීම උදෙසා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීම අවශ්‍ය වේ. |